# 2022 වර්ෂය සඳහා සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම
# මහජන ආරක්ෂක අමාත්‍යාංශය

01. 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ වගන්ති 3:4:3 අනුව මහජන ආරක්ෂක අමාත්‍යාංශය සහ ඊට අනුබද්ධිත පහත සඳහන් ආයතනයන් වෙනුවෙන් 2022 වර්ෂයට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා ඉදි කිරීම්, අළුත්වැඩියාවන් හා භාණ්ඩ සහ සේවා සැපයීම සඳහා විදේශීය නිෂ්පාදකයින්, අනුමත නියෝජිතවරුන්, දේශීය නිෂ්පාදකයින්, දේශීය සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන් සහ උපදේශක ආයතනයන්ගෙන් මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විසින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

- මහජන ආරක්ෂක අමාත්‍යාංශය
- ශ්‍රී ලංකා පොලීසිය
  (පොලිස් විශේෂ කාර්ය බලකාය සහ ශ්‍රී ලංකා පොලිස් අභ්‍යාස ආයතනය ඇතුළුව)

**02. අයදුම් පත්‍ර ලබා ගැනීම**

අ. දේශීය හා විදේශීය අයදුම්කරුවන් හට 2021.11.01 දින සිට 2021.11.30 දින දක්වා පහත සඳහන් වෙබ් අඩවියට පිවිසීමෙන් අයදුම්පත බාගත (Download) හැකිය.

**මහජන ආරක්ෂක අමාත්‍යාංශය - [www.pubsec.gov.lk](http://www.pubsec.gov.lk)**

ආ. ලියාපදිංචි වීමට අදාළ ඉල්ලුම්පත් කට්ටලය පිටු 52 කින් පමණ යුක්ත වන අතර, එය පහත සඳහන් කොටස්වලින් සමන්විත වේ.

1. ප්‍රධාන ඉල්ලුම්පත් පෝරමය
2. විදේශීය සැපයුම් ආයතනයේ දත්ත පෝරමය (ඇමුණුම - A)
3. උපදෙස් හා කොන්දේසි අඩංගු පත්‍රිකා
4. පිටු 40 කින් පමණ යුක්ත විස්තරාත්මක කාණ්ඩ ලැයිස්තුව (Category List)

**03. කාණ්ඩ ගාස්තු ගෙවීම.**

අ. දේශීය සැපයුම්කරුවෙකුගෙන් එක් කාණ්ඩයක් වෙනුවෙන් අය කරනු ලබන ගාස්තුව රු. 1800/- කි.

ආ. විදේශීය සැපයුම්කරුවෙකුගෙන්(දේශීය නියෝජිතයෙකු නොමැති විට) එක් කාණ්ඩයක් වෙනුවෙන් අය කරනු ලබන ගාස්තුව ඇමෙරිකානු ඩොලර් 18 කි.

ඇ. 2022 වර්ෂයට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා කාණ්ඩ ගාස්තු ගෙවීම මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලංකා බැංකුවේ බත්තරමුල්ල ශාඛාවේ අංක 7040131 දරණ ගිණුමට බැර වන පරිදි ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් ගෙවීම් කළ හැකිය. මුදල් තැන්පත් කිරීමේදී ගිණුම් හිමියාගේ නම ලේකම්, මහජන ආරක්ෂක අමාත්‍යාංශය යනුවෙන් සඳහන් විය යුතුය.

ඈ. විදේශීය සැපයුම්කරුවන් ද (දේශීය නියෝජිතයෙකු නොමැති විට) 2022 වර්ෂයට ලියාපදිංචි කිරීමේ කාණ්ඩ ගාස්තු Swift Code භාවිතයෙන් ලංකා බැංකුව වෙත මුදල් ගෙවිය යුතුය.

**Swift No - BCEYLKLX**
**Bank Code - 7010**
**Branch Code- 679**
**Account No - 7040131**

ඉ. කාණ්ඩ ගාස්තු ගෙවීමේදී ඉදිරිපත් කරන මුදල් තැන්පතු පත්‍රිකාව අයදුම්පත්‍රය සමඟ අනිවාර්යයෙන් ඉදිරිපත් කළ යුතුය. (මුදල් ගෙවූ බවට සහතික කෙරෙන පරිදි)

ඊ. දේශීය සැපයුම්කරුවන් හා විදේශීය සැපයුම්කරුවන් කාණ්ඩ ගාස්තු 2021.11.01 දින සිට 2021.11.30 දින දක්වා වූ කාල පරිච්ඡේදය තුළ දී ගෙවා අවසන් කළ යුතුය. 2021.11.30 දිනට පසුව ගෙවනු ලබන කාණ්ඩ ගාස්තු පිළිබඳව මහජන ආරක්ෂක අමාත්‍යාංශය වග කියනු නොලැබේ.

04. යම් අයදුම්කරුවෙකු විසින් ගෙවන ලද කාණ්ඩ ගාස්තු ආපසු ගෙවීමක් සිදු කරනු නොලැබේ. අයදුම්කරුගේ අතපසුවීමකින් හෝ නොසැළකිලිමත්කමින් යම් තොරතුරක් ඉදිරිපත් නොකිරීම, වැරදි කාණ්ඩ ලකුණු කර තිබීම යන හේතු මත අයදුම්පත ප්‍රතික්ෂේප වන අතර, එවැනි අවස්ථාවක වුවද කාණ්ඩ ගාස්තු ආපසු ගෙවීමක් සිදු නොවන බව දන්වනු ලැබේ.

05. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය අදාළ ලිපි ලේඛන සමඟ 2021 දෙසැම්බර් මස 10 දිනට හෝ ඊට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. **ඉල්ලුම්පත්‍ර බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2022 වර්ෂය දේශීය/ විදේශීය"** වශයෙන් සඳහන් කළ යුතුය.

**ප්‍රධාන ගණකාධිකාරි**<br>
**මහජන ආරක්ෂක අමාත්‍යාංශය**<br>
**14 වන මහල, සුහුරුපාය,**<br>
**බත්තරමුල්ල.**

06. 2022 වර්ෂයට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සම්බන්ධව අවසන් තීරණය ගැනීමේ අයිතිය මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් සතු වේ.

**ලේකම්**<br>
**මහජන ආරක්ෂක අමාත්‍යාංශය**